Department of Education,Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

## සති පාසල

විෂය - පෙරදිග සංගීතය

පෙබරවාරි මාසය

ශ්‍රේණිය - 9

3 - සතිය

**නිපුණතාව 1.0 :** සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.3 :** රාගභාවය සහ එකිනෙක වෙනස්කම් ඇතිවීමට බලපාන හේතු විමර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** : ථාටය (මේලය), රාගය, ජාතිය, වාදී, සංවාදී, අනුවාදී, විවාදී,වර්ජිත ස්වර යන පාරිභාෂික පද

ඉහත 1.1.3 ක්‍රියාකාරකමට අදාළ ව සපයා ඇති අංක 01, සහ 02 පැවරුම් සම්පූර්ණ කරන්න.

පැවරුම 01 i. යමන් රාගයට අදාළ විස්තර ඇතුළත් පහත දැක්වෙන වගුව හොඳින් නිරීක්ෂණය කරන්න.

| රාගය | මේලය | වාදී | සංවාදී | ජාතිය | අනුවාදී | විවාදී | වර්ජිත |
|---|---|---|---|---|---|---|---|
| යමන් | කල්‍යාණ | ග | නි | සම්පූර්ණ | ස රි ම ප ධ | ශුද්ධ ම | රි ග ධ නි |

- හින්දුස්ථානී රාගධාරී සංගීතයේ භාවිත වන පාරිභාෂික පද කිහිපයක් වේ.
- රාග ජාති, වාදී, සංවාදී, විවාදී, අනුවාදී, වර්ජය ස්වර ලෙස සෑම රාගයකම මෙම සිද්ධාන්ත කොටස් ඇතුළත් වන අතර රාගයක් විස්තර කිරීමේදී මෙම කොටස් පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතු වේ.
- පහත A B C කොටස්වල දැක්වෙන ස්වර කොටස් පිළිබඳ අවධානයෙන් යුතු ව නිරීක්ෂණය කරන්න.

| A- බිලාවල් රාගය | B –භූපාලි රාගය | C –කාෆි රාගය |
|---|---|---|
| සරිගම,ගරිගප,ධප,මගමරි<br>සරිස, ගමප, ධප ධනිස˚,<br>ධනිස˚රි˚ස˚නිධප,ස˚රි˚ස˚<br>නිධප,පධග,ස˚නිධප<br>මගමරිස | සරිග,සධ,සරිග,පග,රි,<br>සරිස,සරිගප,ග,ගපධ,<br>ගප,ග,ගපධස˚ධප,ග,<br>ගපධස˚රි˚ස˚ධප<br>ග,ගරිධස රිග,පරි-ස | රිගරිම,ගරිස,සනි,සරිරිග,<br>ම-ම,මප,මපගරි,රිනිධනි,<br>පධ මප,ගම පගරි,මපනි<br>නිස˚,ස˚නිධප,මපධ,මප,<br>ගරි,රිගරිම,ගරිස |

මෙහි A B C කොටස්වල දැක්වෙන ස්වර අතරින් කහ වර්ණයෙන් දක්වා ඇති ස්වර වර්ගය හඳුනාගෙන නම් කරන්න. ඒවා එම රාගවල වාදී ස්වර වේ. A B C කොටස්වල දැක්වෙන ස්වර අතරින් රතු වර්ණයෙන් දක්වා ඇති ස්වර වර්ගය හඳුනාගෙන නම් කරන්න. ඒවා එම රාගවල සංවාදී ස්වර වේ. වාදී සංවාදී ස්වර හැර මෙම රාගවල ඔබ හඳුනා ගන්නා ඉතිරි ස්වර ලියන්න. ඒවා අනුවාදී ස්වර වේ. B කොටසෙහි ඇති භූපාලි රාගයට අයත් ස්වර ඛණ්ඩ සියල්ල හොඳින් නිරීක්ෂණය කරමින් එහි යෙදී නොමැති ස්වර දෙක සොයන්න. ඒවා වර්ජය ස්වර නම් වේ.

පැවරුම 02 (ලිඛිත)

i. පහත සඳහන් හිස්තැන්වලට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉරි මත ලියන්න.

රාගයක යෙදෙන ප්‍රබල ම ස්වරය (1)..............ස්වරය නමින් හැඳින්වෙන අතර එම ස්වරයට පසුව යෙදෙන දෙවන ප්‍රධාන ස්වරය වන්නේ (2).............. ස්වරයයි. එම ස්වර දෙක ම හැරුණු විට රාගයේ ඉතිරි ස්වර (3)..............ස්වර නම් වන අතර රාගයක් අලංකාර කිරීම සඳහා ඉඳහිට යෙදෙන ස්වර (4)..............ස්වරය ලෙස හැඳින්වේ. මේලයකට අයත් වුව ද රාගයක කිසිසේත් ම නොයෙදෙන ස්වර (5)..............ස්වර නමින් හැඳින්වේ.

i. වර්ජිත ස්වර    ii. සංවාදී ස්වර    iii. විවාදී ස්වර    iv. වාදී ස්වර    v. අනුවාදී ස්වර

සැකසුම - W.N.ගයානි චන්ද්‍රකාන්ති - ර/නිවි/ඇලපාත මහා විද්‍යාලය